

# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

### තුන්වන වාරය

ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# 20 තෙක් රූප ගණන් කිරීම





**ක්‍රියාකාරකම 01 - ගණන් කරමු**

**සපයා ගත යුතු දේ -**

- පහත දී ඇති රූප පත්‍රිකා විශාලනය කර ෆොටෝ කොපි (photocopy) කර ගැනීම හෝ වර්ණවත් කැලැන්ඩර කොළ, සඟරා, පුවත් පත් කොළවලින් එකම වර්ගයක රූප කපා පහත දී ඇති රටා ආකාරයට ම අලවා ගැනීම.







**දෙමාපියන්ට උපදෙස් -**

- රූප පත්‍රිකාවල ඇති රූප ප්‍රමාණය ගණන් කිරීමට  දරුවාට කියන්න.
- නිවැරදි දැයි බලමු කියා නැවත එම රූප ගණන් කිරීමට කියා දරුවා ගණන් කරන විට ඒ ඒ රූප යටින් හරි (✓) ලකුණ බැගින් දමන්න.
- මේ ආකාරයට ඉතුරු රූප කාඩ්පත් වෙන වෙනම ප්රමාණවත් කාලය ලබා දෙමින් ගණන් කිරීමට දරුවාට කියන්න.

- උච්චාරණය කරන ආකාරය මෙසේ විය යුතුයි.

| | | | |
|---|---|---|---|
| | **තුන** | **නවය** | **පහළොව** |
| | **හතර** | **දහය** | |
| | **පහ** | | **දහසය** |
| | | **එකොළහ** | **දහහත** |
| | **හය** | **දොළහ** | **දහඅට** |
| **එක** | **හත** | **දහතුන** | **දහනවය** |
| **දෙක** | **අට** | **දහහතර** | **විස්ස** |

- උච්චාරණය වැරදි අවස්ථාවල දරුවා නිවැරදි වචනය උච්චාරණයට හුරු කරන්න

---

*ගණිතය වැඩ පොතේ පිටු අංක 68,69 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ දරුවාට පෙන්වන්න.*

---

**ක්‍රියාකාරකම 02 - ගණන් කරමු**

**සපයා ගත යුතු දේ -**

- පහත රූප පත්‍රිකා විශාලනය කර පොටෝ කොපි (photocopy) කර ගැනීම හෝ,
- පෙර පරිදි රූප කපා සකස් කර ගැනීම.
- බණ්ඩක්කා කරලක්, හබරල පිත්තක්, තීන්ත (කුකුල් සායම් /නිල් කුඩු /කහ කුඩුවලින් සකස් කර ගත්)
- භාවිතයෙන් රූප වෙනුවට සීල් මුද්‍රණය කර ගන්න.





**දෙමාපියන්ට උපදෙස් -**

- පෙර පරිදි ම හරි (✓) ලකුණ යොදමින් විසිරී ඇති රූප ගණන් කිරීමට යොමු කරන්න.
- බණ්ඩක්කා කැල්ලක තීන්ත තවරා ගණන් කරමින් සීල් 18,15,17,20,16ක් තැබීමට යොමු කරන්න.

*ගණිතය වැඩ පොතේ පිටු අංක 70,71,72,73 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*